**ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා සංගමය - 2020**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මතය ව්‍යාචනය

ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා සංගමයේ ("සංගමය") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සිදුකිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදෙන වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් විසින් මට සහාය වන ලදී.

සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාචනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ විගණන විෂය පථය යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය**

මාගේ වගකීම වන්නේ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයක් සිදුකර වාර්තාවක් නිකුත් කිරීමයි. කෙසේවෙතත්, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශ |
|---|---|---|
| ශ්‍රී ලංකා මෝටර් රථ ක්‍රීඩා සංගමයේ විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | සංගමය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කළ යුතුය |

**1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විගණන නිරීක්ෂණ | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශ |
|---|---|---|---|---|---|
| (අ) | සමාජික ගාස්තු | 125,000 | සමාජික ලේඛනය | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ආදායම සනාථ කර ගැනීම සඳහා සමාජික ලේඛනයක් ප්‍රමාණවත් පරිදි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | වියදම් | 1,878,816 | ඉන්වොයිසි | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | වියදම සනාථ කර ගැනීම සඳහා ඉන්වොයිසි ප්‍රමාණවත් පරිදි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | අතැති මුදල් | 35,000 | ශේෂ සනාථන | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | අතැති මුදල් සනාථ කර ගැනීම සඳහා ශේෂ සනාථන ප්‍රමාණවත් පරිදි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ගෙවිය යුතු දෑ | 405,000 | තෙවන පාර්ශවීය ඉන්වොයිසි | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ගෙවිය යුතු දෑ සනාථ කර ගැනීම සඳහා තෙවන පාර්ශවීය ඉන්වොයිසි ප්‍රමාණවත් පරිදි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශ |
|---|---|---|
| ලෙජර් ගිණුම් ශේෂයන් සහ විගණනය සඳහා ලබා දී ඇති ශේෂ පිරික්සුම අතර වෙනස්කම් පැවතුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල ශේෂවල නිරවද්‍යතාවය පිළිබඳව සෑහීමට පත්විය නොහැකි විය. | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ලෙජර් ගිණුම් සහ ශේෂ පිරික්සුම නිවැරදිව සකස් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු ගිණුම් සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම් | නිර්දේශ |
|---|---|---|
| ලැබිය යුතු ශේෂය රු. 1,061,000ක් වර්ෂ 03කට වැඩි කාලයක් අයකර ගෙන හෝ මූල්‍ය ප්‍රකාශවල අවශ්‍ය ගැලපීම් කිරීමකින් තොරව හිඟව පැවතුනි. | සංගමයේ අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ලැබිය යුතු ගිණුම් ශේෂයන් අයකර ගැනීම හෝ ගැලපීම් කිරීම සිදු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ සංගමයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,273,499ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 237,876ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,035,623ක පිරිහීමක් නිරීක්ෂණය විය. මුළු ආදායම රු. 2,389,346කින් අඩුවීම සහ මුළු වියදම රු. 1,353,723කින් වැඩිවීම මෙම පිරිහීමට හේතුවිය.